**සුවෙන් පෙරට**

**e ඉගෙනුම් පියස**

**මිනුවන්ගොඩ අධ්‍යාපන**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
வலயக் கல்வி அலுவலகம் - மினுவாங்கொடை
Zonal Education Office - Minuwangoda

වාරය - III

| | | |
|---|---|---|
| ශ්‍රේණිය : 13 | විෂයය : සිංහල | පාඩම :පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය |

- **"පේමතෝ ජායතී සෝකෝ" නාට්‍ය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1) පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයේ ස්වර්ණතිලකාගේ චරිතය දිගහැරෙන්නේ ජීවිත පරිඥානයෙන් හෙබි කාන්තාවක් ලෙසයි. නිදර්ශන සහිතව විමසන්න.

2) උද්දාල බමුණා වෘත්තීය ගුරුවරයෙකු වුවද ප්‍රේමය හමුවේ බොළඳ ගතිගුණ ඇත්තෙකු ලෙස පෙන්වා දීමට නාට්‍යකරු උත්සහ ගෙන ඇත. නාට්‍ය ඇසුරින් උදාහරණ සහිතව විමසන්න.

3) පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය රසවත් නාට්‍යක් බවට පත්වීමට එහි උපයුක්ත ගීතවත් බස බෙහෙවින් උපකාරී වී ඇත. උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

4) නාට්‍යෝචිත අවස්ථා ඉතා සාර්ථක ලෙස දැකගත හැකි නාට්‍යයකි. පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය ප්‍රබල නාට්‍යෝචිත අවස්ථා තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න.

5) ප්‍රේමය යන්න බැහැර කළ යුතු ධර්මතාවක් ලෙස සරත්චන්ද්‍රයන් විසින් නොදක්නා ලද නමුත් නාට්‍ය රචනයේදී බෞද්ධ දර්ශනයේ එන අනිත්‍යතාව පිළිබඳ ධර්මතාවයට එකඟව රචනා කරන ලදී. විමසන්න.

6) ස්වර්ණතිලකා කතා වස්තුවෙන් ඔබ්බට ගොස් , ස්ත්‍රී පුරුෂ මානුෂීය ප්‍රේමය පිළිබඳව කතා කරන නාට්‍යකි, පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය. උදාහරණ දක්වමින් විමසන්න.

7) ප්‍රේමය පිළිබඳව ශෝචනීය අත්දැකීමක් ඉදිරිපත් කරන නාට්‍යකි පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය. විමසන්න.

8) ස්වර්ණතිලකා හමුවේ උද්දාල බමුණා පත්වන අසීරුතාවන් පේමතෝ ජායතී සෝකෝ නාට්‍ය තුළින් විග්‍රහ වන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.

9) උද්දාල බමුණාගේ චරිතය පිළිබඳව විමර්ශනය කරන්න.

10) මෙම නාට්‍ය තුළ ස්වර්ණතිලකාගේ චරිතය දිගහැරෙන්නේ කෙබඳු ආකාරයෙන්දැයි විමසන්න.

**සැකසුම :-**

ආචාරිණී, සුනේත්‍රා විජයලත්.
උසස් පෙළ සිංහල අංශය,
ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය,
ජාතික පාසල,
මීරිගම.